# කෝණකුඹුක්වැව බ්‍රාහ්මීය ශිලා ලිපියේ සදහන් භික්‍ෂුණී ආරාමීය පුරාක්ෂේත්‍රය සොයා සිදුකළ මූලික පුරාවිද්‍යා ගවේෂණය

කෝණකුඹුක්වැවේ පඤ්ඤාලෝක හිමි[68]

කෝණකුඹුක්වැව බ්‍රාහ්මීය ශිලා ලිපිය අනුරාධපුර දිස්ත්‍රික්කයේ රඹෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කෝණකුඹුක්වැව ග්‍රාමසේවා වසමේ පිහිටා තිබේ. එම ග්‍රාමයේ ඇති කෝණකුඹුක්වැව යැයි ව්‍යවහාර කරනු ලබන වැවේ වැකන්දේ මෙම ශිලා ලිපිය දක්නට හැකි ය. මෙම ලිපිය ක්‍රි.ව. 1967දී පිටපත් කර තිබෙන අතර එහි අක්‍ෂර මෙන් ම භාෂාව ක්‍රි.ව. පළමු වැනි හා දෙ වැනි සියවස්වලට අයත් යැයි නිගමනය කර තිබේ. මෙහි සදහන් වන ආකාරයට වැවේ දියවර ගළා යන තිස්ස නම් ඇළෙන් ලැබෙන බද්ද භික්ෂුණී පිරිවෙන් ආරාමයක ආසන හා පාපිසි නඩත්තුවට පූජා කළ බව සදහන් වේ. මෙම භික්ෂුණී පිරිවෙන් ආරාමය සොයා මූලික පුරාවිද්‍යා ගවේෂණයක යෙදීම මෙහි දි සිදුකළ අතර කෝණකුඹුක්වැව බ්‍රාහ්මීය ශිලා ලිපිය අයත් ආංශුක හා විස්තෘත කලාපයේ කිසිදු භූමියක භික්ෂුණී පිරිවෙන් ආරාමයක් තිබේ යැයි පුරාවිද්‍යා වාර්තාවක හෝ ජනශ්‍රැතියක සදහන් නොවේ. එහෙත් පාළුගෝණමැරියාව, පිනගම, මයිලගම්මන, කුරුදුගොඩ ග්‍රාමයන්හි මුල් ඓතිහාසික යුගයේ ජනාවාස පැවැති බවට උපකල්පනය කළ හැකි සාධක දැකිය හැකිය. මේ අතර කෝණකුඹුක්වැව ග්‍රාමයේ කොළගම යැයි හඳුන්වන පාළුගෝණමැරියා ගමෙහි වැව ආශ්‍රිත ක්ෂේත්‍රයේ මුල් ඓතිහාසික යුගයේ ජනාවාස පැවැති බවට උපකල්පනය කළ හැකි කටාර කෙටූ ගුහා පියස්සක් හා ලී කණු මෙන් ම මැටි බදුන් කැබලි සාධක දක්නට ලැබෙන අතර වෙනත් ක්ෂේත්‍රවලට වඩා මෙහි මැටි බදුන් කැබලි සාධක අධික ස්වභාවයක් හා විශාල භූමියක පැතුරුණු ස්වභාවයක් පෙනෙන්නට තිබේ. එහි ද කටාර කෙටූ ගුහා පියස්සක් ද දක්නට ලැබෙනුයේ තත් ක්ෂේත්‍ර අතර මෙහි පමණි. මේ අනුව භික්ෂුණී පිරිවෙන් ආරාමය යැයි උපකල්පනයට එළඹිය හැකි ක්ෂේත්‍ර පිළිබඳ ව පුරාවිද්‍යාත්මක අධ්‍යයන මෙතෙක් සිදු වී නැති හෙයින් මෙකී වටිනා සාධකවලින් යුක්ත ක්ෂේත්‍ර පිළිබඳ ව පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක් සිදු කර ප්‍රස්තුතයට උපකල්පන අර්ථයක් ලබා දීම මෙම අධ්‍යයනයෙන් බලාපොරොත්තු වේ.

ප්‍රමුඛ පද: කෝණකුඹුක්වැව බ්‍රාහ්මීය ශිලා ලිපිය, අවට පුරාක්ෂේත්‍ර, පාළුගෝණමැරියාව පුරාක්ෂේත්‍රය

[68] පුරාවිද්‍යා අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය.